පසුගිය ප්‍රශ්නපත්‍ර
අ.පො.ස..සාමාන්‍ය පෙළ
ගිණුම්කරණ සමීකරණය

පහත ලබාදී ඇති පසුගිය ප්‍රශ්නපත්‍ර වලට පිළිතුරු තම පුනරීක්ෂණය අභ්‍යාස පොතේ ලියන්න.

2015

**5.** (i) පහත දැක්වෙන්නේ වෙළෙඳ ව්‍යාපාරයක සිදු වූ ගනුදෙනු කිහිපයකි.

(අ) අයිතිකරු රු. 50 000 ක මුදලක් ප්‍රාග්ධනය ලෙස යෙදවීම
(ආ) රු. 25 000 ක බැංකු ණය මුදලක් ලබා ගැනීම
(ඉ) රු. 15 000 ක බඩු තොගයක් ණයට ගැනීම
(ඊ) රු. 3 000 ක මාසික විදුලි බිල්පත ගෙවීම
(උ) රු. 100 000 ක ලී බඩු, මොරටු ලී බඩු වෙළෙඳුන්ගෙන් ණයට ගැනීම

**අවශ්‍ය වන්නේ:**
ඉහත එක් එක් ගනුදෙනුවට අදාළ මූලාශ්‍ර ලේඛනය හා එම ගනුදෙනුව හර වන ගිණුම හා බැර වන ගිණුම ලියා දක්වන්න. (පිළිතුරු සැපයීමේ දී පහත ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න. පළමු ගනුදෙනුව ඔබ වෙනුවෙන් සටහන් කර දක්වා ඇත.)

| ගනුදෙනුව | මූලාශ්‍ර ලේඛනය | හර වන ගිණුම | බැර වන ගිණුම |
|---|---|---|---|
| (අ) | ලදුපත | මුදල් ගිණුම | ප්‍රාග්ධන ගිණුම |
| (ආ) | | | |
| (ඉ) | | | |
| (ඊ) | | | |
| (උ) | | | |

(ලකුණු 04 යි)

2016

(iii) තරිඳු පාසල් උපකරණ අලෙවි කිරීමේ ව්‍යාපාරයක් 2016.01.01 දින ආරම්භ කරන ලදී. එදින සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. තරිඳු ව්‍යාපාරයට මුදල් යෙදවීම රු. 50 000
2. ලී බඩු අත්පිට මුදලට ගැනීම රු. 20 000
3. ගොඩනැගිල්ලට මාසික කුලිය ගෙවීම රු. 5 000
4. බැංකු ණයක් ලබා ගැනීම රු. 25 000
5. පාසල් උපකරණ ණයට ගැනීම රු. 10 000

**අවශ්‍ය වන්නේ:**
(අ) ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දක්වන්න. (පිළිතුරු සැපයීමේ දී පහත ආකාරයේ ආකෘතියක් භාවිත කරන්න. පළමු ගනුදෙනුව ඔබ වෙනුවෙන් සටහන් කර දක්වා ඇත.)

| ගනුදෙනුව | වත්කම් = වගකීම් + අයිතිකරුගේ හිමිකම |
|---|---|
| 1 | මුදල් +50 000 = ප්‍රාග්ධනය +50 000 |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |

(ආ) 2016.01.01 දිනට තරිඳුගේ ව්‍යාපාරයේ පහත සඳහන් අයිතමවල වටිනාකම වෙන වෙන ම දක්වන්න.
1. ජංගම නොවන වත්කම් 2. ජංගම වත්කම් 3. මුළු වගකීම් 4. හිමිකම

(ලකුණු 04 යි)

2017

(iii) විදුලි උපකරණ අලෙවි කරන සමන්තගේ ව්‍යාපාරයේ 2018 ජනවාරි 31 දිනෙන් අවසන් වූ මාසයේ සිදු වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. රු. 100 000 ක බැංකු ණය මුදලක් ලබා ගැනීම
2. රු. 50 000 ක් වටිනා විදුලි උපකරණ තොගයක් ණයට ගැනීම
3. ණයහිමියන්ට රු. 8 000 ක් මුදලින් ගෙවීම
4. රු. 25 000 ක් පිරිවැය වූ විදුලි උපකරණ තොගයක් රු. 40 000 කට අත්පිට මුදලට විකිණීම
5. සමන්ත පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 5 000 ක් ව්‍යාපාරයේ මුදලින් ගැනීම

**අවශ්‍ය වන්නේ:**

(අ) ඉහත එක් එක් ගනුදෙනුව ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දැක්වීම
(පිළිතුරු සැපයීමේදී පහත දැක්වෙන ආකෘතිය භාවිත කරන්න. පළමු ගනුදෙනුව සටහන් කර ඇත.)

| ගනුදෙනුව | වත්කම් (රු.) | | | = හිමිකම් (රු.) | + වගකීම් (රු.) | |
|---|---|---|---|---|---|---|
| | ලිබඩු හා උපකරණ | තොගය | මුදල් | හිමිකම් | බැංකු ණය | ණයහිමියෝ |
| 2018.01.01 දිනට ශේෂය | 160 000 | 70 000 | 25 000 | 235 000 | – | 20 000 |
| 1 | – | | + 100 000 | | + 100 000 | – |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |

(ආ) 2018.01.31 දිනට සමන්තගේ ව්‍යාපාරයේ පහත සඳහන් අයිතමවල අගය කොපමණ ද?
1. ජංගම වත්කම්
2. ජංගම නොවන වත්කම්
3. ජංගම වගකීම්
4. ජංගම නොවන වගකීම් (ලකුණු 04 යි)

2018

5. (i) (අ) වගකීමක් යනු කුමක් ද?
(ආ) ලෙජරයේ දැකිය හැකි ගිණුම් වර්ග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත ගනුදෙනුවලට අදාළ ද්විත්ව සටහන් ලියන්න.
(අ) අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා මුදලින් රු. 2 000 ක් ගැනීම
(ආ) ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ඔටෝ ට්‍රේඩර්ස් වෙතින් රු. 500 000 ක් වටිනා මෝටර් රථයක් ණයට ගැනීම (ලකුණු 02 යි)

(iii) ව්‍යාපාරයක 2017.01.01 දිනට පැවති වත්කම්, වගකීම් හා හිමිකම් ශේෂ සහ ජනවාරි මාසයේ පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණය යටතේ සටහන් කර තිබූ ආකාරය පහත දැක්වේ.

| | | වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|---|---|
| 2017.01.01 ශේෂය | | 200 000 | = | 150 000 | | 50 000 |
| | (1) | + 25 000 (මුදල්) | = | – | | + 25 000 (බැංකු ණය) |
| | (2) | – 10 000 (බඩු තොගය)<br>+ 15 000 (ණයගැතියෝ) | = | + 5 000 (ලාභය) | | – |
| | (3) | – 7 000 (මුදල්) | = | – 7 000 (කඩ කුලී) | | – |
| | (4) | – 6 000 (මුදල්) | = | – | | – 6 000 (ණයහිමියෝ) |

**අවශ්‍ය වන්නේ:**

(අ) ඉහත එක් එක් ගනුදෙනුව අගයයන් සහිතව ලිවීම
(ආ) සතිය තුළ දී මුළු වත්කම්වල සහ මුළු හිමිකම්වල වැඩි වීම හෝ අඩු වීම වෙන වෙන ම දැක්වීම (ලකුණු 04 යි)

ඉහත ලබාදී ඇති පසුගිය ප්‍රශ්නපත්‍ර වලට පිලිතුරු තම පුනරීක්ෂණය අභ්‍යාස පොතේ ලියන්න.